# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,994 - 2016 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2016.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2804 |



*සැ. යු.* - (i) ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජූලි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 අගෝස්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ජයමග සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2016 දෙසැම්බර් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 නොවැම්බර් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2801- B 81116 — 5,403 (2016/11)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩද-ාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෙ-ා්ජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරී-මෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේ-වකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### ජාතික කලායතන විභාගය - 2016

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන ජාතික කලායතන විභාගය ප්‍රථම වසර හා දෙවන වසර විභාග 2017 පෙබරවාරි මාසයේ දී පැවැත්වීම සඳහා සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය උඩරට නැටුම් විෂය/පහතරට නැටුම් විෂය/සබරගමු නැටුම් විෂය සහ සංගීත විෂයයන් යටතේ ලිඛිත පරීක්ෂණයකින් සහ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ තෝරාගත් ප්‍රධාන විෂය සඳහා වන අතර ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන්නේ ප්‍රධාන විෂයට අදළ ප්‍රායෝගික හැකියාව පරීක්ෂා කිරීම සඳහාය.

02. විභාගය උපලේඛනය 1 හි දක්වා ඇති නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් කළයුතු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරනු ලබන නගරය එම ලේඛනයට අනුවම විය යුතු අතර, ඉල්ලුම් කරන ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ නොදේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් ආසන්න වෙනත් නගරයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

03. මෙම විභාගය පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි. පහත සඳහන් විෂයන් සඳහා අයදුම්කරුවන්ට අයදුම් කළ හැක.

| *විෂය* | *ප්‍රථම වසර* | *දෙවන වසර* |
|---|---|---|
| | *විෂය අංකය* | *විෂය අංකය* |
| උඩරට නර්තනය | 11 | 21 |
| පහතරට නර්තනය | 12 | 22 |
| සබරගමු නර්තනය | 13 | 23 |
| සංගීතය | 14 | 24 |
| සංස්කෘතික පසුබිම | 15 | 25 |

ඉහත සඳහන් ප්‍රධාන විෂයයන්ගෙන් එකක් සඳහා පමණක් අයදුම්කරුවන් අයදුම් කළ යුතුය. කලායතනාධිපති විසින් අයදුම්පත සම්පූර්ණ කර, අයදුම්පත් භාරගන්නා දිනයට පෙර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු අතර, පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මෙම විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් යුක්තය. ලිඛිත පරීක්ෂණයේ දී එක් විෂය කාණ්ඩයකට කොටස් දෙකකින් යුත් ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙක බැගින් ලැබේ. මෙවර මෙම විභාගය කලායතනවල සිටින ප්‍රථම වසර සිසුන්ට හා දෙවන වසර සිසුන්ට පමණක් පැවැත්වේ.

4.1 ප්‍රථම වසර :

01. විෂය අංකය (11) උඩරට නර්තනය (මුළු ලකුණු 100කි.)

111 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45 කි.)
112 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02 කි.)

02. විෂය අංකය (12) පහතරට නර්තනය (මුළු ලකුණු 100කි.)

121 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45කි.)
122 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)

03. විෂය අංකය (13) සබරගමු නර්තනය (මුළු ලකුණු 100 කි.)
131 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45කි.)
132 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)

04. විෂය අංකය (14) සංගීතය (මුළු ලකුණු 100කි.)
141 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45කි.)
142 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)

05. විෂය අංකය (15) සංස්කෘතික පසුබිම (මුළු ලකුණු 100කි.)
පොදු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45 කි.)

4.2 දෙවන වසර :

01. විෂය අංකය (21) උඩරට නර්තනය (මුළු ලකුණු 100කි.)
211 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45කි.)
212 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)

02. විෂය අංකය (22) පහතරට නර්තනය (මුළු ලකුණු 100කි.)
221 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45කි.)
222 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)

03. විෂය අංකය (23) සබරගමු නර්තනය (මුළු ලකුණු 100කි.)
231 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45 කි.)
232 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)

04. විෂය අංකය (24) සංගීතය (මුළු ලකුණු 100කි.)
241 පළමු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45කි.)
242 දෙවන ප්‍රශ්න පත්‍රය (කාලය පැය 02කි.)

05. විෂය අංකය (25) සංස්කෘතික පසුබිම (මුළු ලකුණු 100කි.)
පොදු ප්‍රශ්න පත්‍රය (කාලය විනාඩි 45කි.)

සියළුම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලිඛිත විභාගයට පෙනී සිටි විෂය යටතේම ප්‍රායෝගික විභාගය කිරීම අනිවාර්ය වේ. සංස්කෘතික පසුබිම (05) නම්, පොදු ප්‍රශ්න පත්‍රයට සියලුම අයදුම්කරුවන් පෙනී සිටීම අනිවාර්ය වේ. ඒ අනුව එක් අයදුම්කරුවෙකු එක් ප්‍රධාන විෂය කාණ්ඩයක් සඳහා ලිඛිත වි. 45ක පළමු ප්‍රශ්න පත්‍රයට හා පැය 2ක ලිඛිත දෙවන ප්‍රශ්න පත්‍රයට ද, වි. 45ක පොදු ප්‍රශ්න පත්‍රය ද ඇතුළුව ලිඛිත ප්‍රශ්න පත්‍ර 3කට පෙනී සිටිය යුතුය.

*සැ. යු.* :

මෙම සියලු ප්‍රශ්න පත්‍ර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කලායතන සඳහා අනුමත නර්තන/සංගීත විෂය නිර්දේශයට අනුකූලව සකසනු ලැබේ.

සියලුම විෂයන්ට අදාළ ලිඛිත හා ප්‍රායෝගික විෂය ක්ෂේත්‍රය කලායතන සඳහා ලබා දී ඇති කලායතන විෂය නිර්දේශයට අදාළව සැකසේ. සෑම ප්‍රථම වසර හා දෙවන වසර අයදුම්කරුවෙකුම ''සංස්කෘතික පසුබිම'' නම් පොදු බහුවරණ ප්‍රශ්න පත්‍රයක් සඳහා වි. 45ක කාලයක් පෙනී සිටිය යුතුය. එම ප්‍රශ්න පත්‍රය සඳහා ශ්‍රී ලංකාවේ සංස්කෘතිය සම්බන්ධයෙන් කෙටි ප්‍රශ්න 30ක් ඉදිරිපත් වේ.

ප්‍රථම වසර :

(අ) උඩරට නර්තනය විභාග සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 111 වන හා 112 වන ප්‍රශ්න පත්‍ර ලැබෙන අතර, 111 වන ප්‍රශ්න පත්‍රය සඳහා උඩරට නර්තන සම්ප්‍රදායට අදාළ බහුවරණ ප්‍රශ්න 25ක් සඳහා විනාඩි 45කින් පිළිතුරු ලබාදීමට සිදුවේ.

112 වන ප්‍රශ්න පත්‍රය ''ශාස්ත්‍රීය අවබෝධය'' ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනී සිටිය යුතුය.

ලිඛිත විෂය නිර්දේශය :

ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඉතිහාසය, උඩරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ හා ප්‍රභවයට බලපෑ හේතු සාධක, කොහොඹා කංකාරි ශාන්තිකර්මය, මාත්‍රා වර්ග, තාලම්පටෙහි ධ්වනි ප්‍රභේද, දණ්ඩිය, මණ්ඩිය, සාම්ප්‍රදායික හා ව්‍යවහාරික තිත් ක්‍රම, කවි හා බෙරපද ප්‍රස්තාර, උඩරට සාම්ප්‍රදායික බෙරය

ප්‍රායෝගික විෂය නිර්දේශය :

පා සරඹ 12 හා හමාර පදය, ගොඩ සරඹ 12 හා කස්තිරම්, කුදංත ගතදෙං හා කුඳ කුජගත වට්ටම, මංගලම්, හනුමා, වෛරොඩි, සිංහරාජ, තුරගා, නෛයඩි, සැවුලා වන්නම්, පන්තේරු, කොල්මුර, ජන නැටුම්, සිරසපාද, මල්යහන්, ග්‍රහ පන්ති, ආශිර්වාද කවි)

අනු විෂය - උඩරට බෙර වාදනය

අංගුලියා පදය හා බෙරපදර 1 සිට 6 දක්වා, තනි තිතේ තාල රූපවලට අයත් මුල පද හා අලංකාර පද, ගායනය සමග බෙර වාදනය

(ආ)පහතරට නර්තන විභාග සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 121 වන හා 122 වන ප්‍රශ්න පත්‍ර ලැබෙන අතර, 121 වන ප්‍රශ්න පත්‍රය සඳහා පහතරට නර්තන සම්ප්‍රදායට අදාළ බහුවරණ ප්‍රශ්න 25ක් සඳහා විනාඩි 45කින් පිළිතුරු ලබාදීමට සිදුවේ.

122 වන ''ශාස්ත්‍රීය අවබෝධය'' ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනී සිටිය යුතුය.

ලිඛිත විෂය නිර්දේශය :

ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඉතිහාසය, පහතරට නර්තනය ප්‍රචලිත ප්‍රදේශ හා ප්‍රභවයට බලපෑ හේතු සාධක, දෙවොල් මඩු ශාන්තිකර්මය, මාත්‍රා වර්ග, තාලම්පටෙහි ධ්වනි ප්‍රභේද, දණ්ඩිය, මණ්ඩිය, සාම්ප්‍රදායික හා ව්‍යවහාරික තිත් ක්‍රම, ප්‍රස්තාර, පහතරට සාම්ප්‍රදායික බෙරය

ප්‍රායෝගික විෂය නිර්දේශය :

දණ්ඩියමේ සරඹ 12, ඉලංගම් සරඹ 12 සහ ඉරට්ටි, ගුදගති ගත වට්ටම, මාත්‍රා පහතට අයත් පද හා ඉරට්ටි, ගිරිදේවි නැටුම, සින්දු වන්නම් (අනුරාග දණ්ඩතාලය, ලලිත රාග තාලය, හනුමන්තා තාලය, හවාදී තාලය, නාති ලිංචි තාලය) ශුද්ධ මාත්‍රා නැටුම, මල් අස්නේ කවි, ජන නැටුම්, සිරස පාද කවි, වයන්තිමාලයේ කවි, ග්‍රහ පන්ති කවි, ආශිර්වාද කවි.

අනු විෂය - පහතරට බෙර වාදනය

බෙර සරඹ 1 සිට 6 දක්වා තනි තිතේ සහ දෙතිතේ තාල රූප වලට අයත් මුල පද සහ අලංකාර පද වාදනය, ගායනය සමග බෙර වාදනය

(ඇ)සබරගමු නර්තන විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 131 වන හා 133 වන ප්‍රශ්න පත්‍ර ලැබෙන අතර, 131 වන ප්‍රශ්න පත්‍රය සඳහා සබරගමු නර්තන සම්ප්‍රදායට අදාළ බහුවරණ ප්‍රශ්න 25ක් සඳහා විනාඩි 45 කින් පිළිතුරු ලබාදීමට සිදුවේ.

133 වන ප්‍රශ්න පත්‍රය ''ශාස්ත්‍රීය අවබෝධය'' ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනීසිටිය යුතුය.

ලිඛිත විෂය නිර්දේශය :

ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඉතිහාසය, සබරගමු නර්තනය ප්‍රචලිත ප්‍රදේශ හා ප්‍රභවයට බලපෑ හේතු සාධක, පහන්මඩු ශාන්තිකර්මය, මාත්‍රා වර්ග, තාලම්පටෙහි ධ්වනි ප්‍රභේද, දණ්ඩිය,

මණ්ඩිය, සාම්ප්‍රදයික හා ව්‍යවහාරික තිත් ක්‍රම, ප්‍රස්තාර, සබරගමු සාම්ප්‍රදයික බෙරය

ප්‍රායෝගික විෂය නිර්දේශය :

දෙඹින පද 12 සහ හමාර පදය, මණ්ඩි පද දෙළස, මුල් මාත්‍රය, ගමන් මාත්‍රය, පත්තුතාල මාත්‍රය, වන්නම් (කොවුලා, අනිලා, ආනන්ද, කිඳුරු, තිසරා), යාදිනි මාත්‍රය, සමන් දෙවියන්ගේ සහ විෂ්ණු දෙවියන්ගේ මල් යහන් කවි ගයමින් නැටීම, කළගෙඩි නැටුම සහ ලී කෙලි නැටුම, ගායනය (සිරස පාද කවි, කෝල්මුර කවි, ග්‍රහපන්ති කවි, ආශිර්වාද කවි)

අනු විෂය - සබරගමු බෙර වාදනය

දවුල් සරඹ 1 - 6 දක්වා, තනිතිතේ සහ දෙතිතේ තාලරූපවලට අයත් මුල පද සහ අලංකාර පද වාදනය, සබරගමු නර්තනය - පළමු වසර නර්තන ප්‍රායෝගික කොටස්වලට අදළ නර්තන හා දවුල් වාදන, ගායනය හා දවුල් වාදනය.

(ඈ) සංගීත විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 141 කොටස හා 142 කොටස සමන්විත ප්‍රශ්න පත්‍රයක් ලැබෙන අතර, 141 වන ප්‍රශ්න පත්‍රය සඳහා සංගීත සම්ප්‍රදයට අදළ බහුවරණ ප්‍රශ්න 25ක් සඳහා විනාඩි 45කින් පිළිතුරු ලබාදීමට සිදුවේ. ප්‍රශ්න පත්‍රය ''ශාස්ත්‍රීය අවබෝධය'' (සංගීත සම්ප්‍රදය හා සංස්කෘතික පසුබිම අදළව ප්‍රශ්න අන්තර්ගත වේ.) ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනී සිටිය යුතුය.

උක්ත 141 හා 142 ප්‍රශ්න පත්‍රය සංගීතය, ගායනය හා ස්වර වාද්‍ය භාණ්ඩ සඳහා ඉදිරිපත් වන සැමටම පොදු ප්‍රශ්න පත්‍රයක් ලෙස සකස් කර ඇත.

ජන සංගීතය පිළිබඳ මූලික අවබෝධය හා එහි විශේෂ ලක්ෂණ, ගීත ප්‍රස්තාරකරණය පිළිබඳ දැනුම හා ප්‍රශස්ති ගී පිළිබඳ අවබෝධය, නූර්ති නාඩගම්, කවි නාඩගම් හා කෝලම් යන ජන නාට්‍ය ක්‍රමයන් පිළිබඳව මූලික අවබෝධය හා ඒවායේ විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම, මූලික තිත් රූප තුන පිළිබඳ දැනුම හා ප්‍රස්තාරකරණය, පාරිභාෂික වචන පිළිබඳ අවබෝධය, රාග අවබෝධය, රාගධාරී ගිත හෝ වාදිත ප්‍රස්තාරකරණය, නියමිත තාල ප්‍රස්තාරකරණය, එම්. ජී. පෙරේරා, ලයනල් එදිරිසිංහ, විෂ්ණුනාරායන භාත්ඛණ්ඩේ පඬිතුමා ආදීන්ගෙන් සංගීතයට සිදුවූ සේවය, ගායකයින් හා වාදකයින් තමා උපයෝගී කර ගන්නා වාද්‍ය භාණ්ඩ සුසර කර ගැනීම පිළිබඳව දැනුම හා ව්‍යුහය පිළිබඳ අවබෝධය.

ප්‍රායෝගික විෂය නිර්දේශය :

ජන ගීත, ස්වර අභ්‍යාස, රාග සම්බන්ධ දැනුම (විෂය නිර්දේශයට අදළව)

අනු විෂය

ස්වර අභ්‍යාස, නියමිත රාග, නියමිත තාල, ජන ගී, ජාතික ගීය ගායනය හෝ වාදනය, නූර්ති ගීත, ජන නාට්‍ය ගීත ගායනය හෝ වාදනය.
දෙවන වසර

(ඉ) උඩරට නර්තන විභාග සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 211 වන හා 212 වන ප්‍රශ්න පත්‍ර ලැබෙන අතර, 211 වන ප්‍රශ්න පත්‍රය සඳහා උඩරට නර්තන සම්ප්‍රදයට අදළ බහුවරණ ප්‍රශ්න 25 ක් සඳහා විනාඩි 45කින් පිළිතුරු ලබාදීමට සිදුවේ.

212 වන කොටස ''ශාස්ත්‍රීය අවබෝධය'' ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනී සිටිය යුතුය.

ලිඛිත විෂය නිර්දේශය :

ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඉතිහාසය, තනි තිත, දෙතිත හා තුන් තිතට අයත් ප්‍රභේද හා අප්‍රචලිත තිත් රූප පිළිබඳ අවබෝධය, වලියකුම ශාන්තිකර්මය උපත් කථාව පැවැත්වීමේ අරමුණ සහ පුද පූජා රටාව, උඩරට සාම්ප්‍රදයික වන්නම්, පන්තේරු, උඩැක්කි, රබන් යන සබරගමු නැටුම් හා බැඳි සංස්කෘතික හා ඓතිහාසික පසුබිම, පංචතාලය, පංචාංගය, පංචතූර්ය වර්ගීකරණය පිළිබඳ සම්ප්‍රදයික සහ අද්‍යතන විග්‍රහයන්, ප්‍රශස්ති, හටන් කවි ගායනයන්ගේ සුවිශේෂ ලක්ෂණ.

ප්‍රායෝගික විෂය නිර්දේශය :

දෙං ජිංත ගත දෙංත වට්ටම, ගොග් ගොග් ජිං ජිංගත වට්ටම, කිරලා, මයුරා, සුරපති, ගණපති, ඊරඩි හා මුසලඩි වන්නම්, යක්ඇනුම, හත්පද පෙළපාලිය, වැදියක් කෝල්පාඩුව, පන්තේරු නැටුම, උඩැක්කි නමස්කාර සරඹය හා දෙංත පහේ තාල අනුව නැටීම, කොල්මුර කවි ගයමින් නැටීම, බලි කවි ගායනය සමග නර්තනය, ජන නැටුම්, ගායනය සඳහා කුවේණි අස්නේ කවි, හගල යැදිම, අයිලේ යැදිම, කඩවර කවි.

අනු විෂය - බෙර වාදනය

බෙර සරඹ 7 - 12 දක්වා, දෙතිතේ තාලරූපවලට අයත් මුල පද සහ අලංකාර පද වාදනය, උඩරට නර්තනය දෙවන වසර නර්තන ප්‍රායෝගික විෂය කොටස් වලට අදළව බෙර වාදනය, මගුල් බෙර පළමු හා දෙවන වට්ටම, දෙතිතට අයත් අත්‍යා බෙර පද වාදනය.

(ඊ) පහතරට නර්තන විභාග සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 221 වන හා 222 වන ප්‍රශ්න පත්‍ර ලැබෙන අතර, 221 වන ප්‍රශ්න පත්‍රය සඳහා පහතරට නර්තන සම්ප්‍රදයට අදළ බහුවරණ ප්‍රශ්න 25ක් සඳහා විනාඩි 45කින් පිළිතුරු ලබා දීමට සිදුවේ.

222 වන ''ශාස්ත්‍රීය අවබෝධය'' ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනී සිටිය යුතුය.

ලිඛිත විෂය නිර්දේශය :

ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම, දඹදෙනිය යුගයේ සිට මහනුවර යුගය දක්වා (මාතර යුගය ද, ඇතුළුව) ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම තනි තිත, දෙතිත සහ තුන් තිතට අයත් ප්‍රභේද පංචතූර්ය වර්ගීකරණය පිළිබඳ මතසන්නියකුම සහ සූනියම් යාගය පිළිබඳ පුරාවෘත, පුද පූජා රටාව, සැරසිලි සින්දු වන්නම්, වන්නම්, ප්‍රශස්ති, හටන් කවි යන ඒවායේ ආවේණික ලක්ෂණ සහ ඓතිහාසික පසුබිම පහතරට නර්තන සම්ප්‍රදයට අයත් නළු ඇඳුම් කට්ටල පිළිබඳ විස්තර, කෝලම් නාටක - ඓතිහාසික පසුබිම සුවිශේෂ ලක්ෂණ.

ප්‍රායෝගික විෂය නිර්දේශය :

යහන් දැක්ම, ගෙජ්ජි මාත්‍රාව, සින්දු වන්නම්, දෙවොල් පද සහ සුරල්, හත්පද පෙළපාලිය, මඟුල් රාගය, කෝලම් නැටුම, සවිඳම් නැටීම, රාග පද, පත්තිනි පද තුනක් සහ සුරල්, ජන නැටුම්, ගායනය - 'යකුන්ට කියන කවි (රිරියකා, කළුයකාගේ අටකොණ) - උපත් කවි දෙහි උපත, පොල් උපත, හත් අඩියේ කවි, රට යකුමේ, නානමුර කවි.

අනු විෂය - පහතරට බෙර වාදනය :

බෙර සරඹ 7 සිට 12 දක්වා, මඟුල් බෙර පළමුවන වට්ටම, පහතරට නර්තනය දෙවන වසර නර්තන ප්‍රායෝගික විෂය කොටස්වලට අදළ බෙර වාදනය, සවිඳමක් ගායනය සහ වාදනය, දෙතිතේ තාල රූපවලට යෙදෙන සරල කවි තාල ගායනය කරමින් වාදනය.

(ඇ) සබරගමු නර්තන විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 231 වන හා 232 වන ප්‍රශ්න පත්‍ර ලැබෙන අතර, 231 වන ප්‍රශ්න පත්‍රය සඳහා සබරගමු නර්තන සම්ප්‍රදයට අදළව බහුවරණ ප්‍රශ්න 25ක් සඳහා විනාඩි 45කින් පිළිතුරු ලබාදීමට සිදුවේ.

232 වන ප්‍රශ්න පත්‍රය ''ශාස්ත්‍රීය අවබෝධය'' ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනී සිටිය යුතුය.

ලිඛිත විෂය නිර්දේශය :

ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඓතිහාසික පසුබිම, තනි තිත, දෙතිත සහ තුන් තිතට අයත් ප්‍රභේද, අප්‍රකට තිත් රූප, සබරගමු සාම්ප්‍රදයික යක් තොවිල් පිළිබඳ තොරතුරු, පංචතාලය, පංචාංගය සහ පංචතූර්ය වාදනය පිළිබඳ මත, සබරගමු නර්තන ශිල්පීන්ගේ රංග වස්ත්‍රාභරණ, සබරගමු සාම්ප්‍රදයික වන්නම්, ප්‍රශස්ති ගායනාවල දක්නට ඇති සුවිශේෂී ලක්ෂණ සහ ඓතිහාසික පසුබිම.

ප්‍රායෝගික විෂය නිර්දේශය :

යක්පද මාත්‍රාව, සින්දු මාත්‍රය, වන්නම් (කදම්භ, පක්ෂි, මණ්ඩුක, මේස, නාග, ගජගා, විරාඩි), යහන් දැක්ම, හත්පද පෙළපාලිය, දේවකෝල්පාඩුව, කිරිමඩුවේ එන නානු මුරය, දෙවොල්, කාගුල්, කොලොන්න යන පද, අත් මිණි උපත, බලි ශාන්තිකර්මයේ එන තාල නමයේ ගුහ පන්ති ගයමින් නැටීම, ජන නැටුම්, ගායනය - පිරිත් හුයේ කවි, අටමඟලට අයත් ගායනා මල් මඩුපුරේ කවි, පන්දම් උපතේ කවි.

අනු විෂය - සබරගමු බෙර වාදනය :

දවුල් සරඹ 7 සිට 12 දක්වා වාදනය, පූජා මංගල දවුල් වාදනය, මංගල දවුල් වාදනය, පළමු වැනි වට්ටම, උගත් සවිඳම්වලින් එකක් ගායනය සමග වාදනය, සබරගමු දෙවන වසර ප්‍රායෝගික විෂය කොටස්වලට අදළ වාදනය.

(ඈ) සංගීතය විභාග සඳහා පෙනී සිටින අයදුම්කරුවන් සඳහා 241 වන හා 242 වන ප්‍රශ්න පත්‍ර ලැබෙන අතර, 241 වන ප්‍රශ්න පත්‍රය සඳහා සංගීත සම්ප්‍රදයට අදළ බහුවරණ ප්‍රශ්න 25ක් සඳහා විනාඩි 45කින් පිළිතුරු ලබා දීමට සිදුවේ. 242 වන කොටස ''ශාස්ත්‍රීය අවබෝධය'' ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා පැය 2ක කාලයක් පෙනී සිටිය යුතුය.

ලිඛිත විෂය නිර්දේශය :

උක්ත 241 හා 242 ප්‍රශ්න පත්‍රය සංගීතය, ගායනය හා ස්වර වාද්‍ය භාණ්ඩ සඳහා ඉදිරිපත්වෙන සැමටම පොදු ප්‍රශ්න පත්‍රයක් ලෙස සකස් කර ඇත.

ගොයම් නෙළීමේ ගී, රබන් ගී හා ඔන්චිලි වාරම් ගීවල සමාජ පසුබිම පිළිබඳ අවබෝධය, අටමත්, දසමත්, දෙළොස්මත් සහ සොළොස් මත් සේ ගී හා ග්‍රහ පිළිබඳ දැනුම, තිත් ප්‍රභේද ජන ගායනාවලට උපයෝගී කොට ඇති අන්දම, ගී, කවි, සිංදු සිලෝ, ගද්‍ය පද්‍ය, චම්පු, අෂ්ඨක, ස්තෝත්‍ර යන ප්‍රබන්ධ පිළිබඳ දැනුම, උඩරට හා පහතරට ශාන්ති කර්ම ගීත පිළිබඳ අවබෝධය, නාද ප්‍රභේද පිළිබඳ දැනුම, තිත් රූප, ජන ගී, වන්නම්, නූර්ති ගී හා නාඩගම් ගී ප්‍රස්තාරකරණය, රාග පිළිබඳ දැනුම හා ප්‍රස්තාරකරණය, ව්‍යාංකට්මුඛීගේ මේල වර්ගීකරණය, උත්තර භාරතීය සංගීතයේ දසඨාට වර්ගීකරණය, භාරතීය සංගීත ඉතිහාසය හා මෝගල් යුගයේ බලපෑම, ධ්‍රැපද්, ධමාර්, ඛ්‍යාල්, තරානා, ඨුම්රි, ගසල්, ඛවාලී යන ගායන ශෛලීන් පිළිබඳ දැනුම, සංගීත භාණ්ඩ සුසර කර ගැනීම පිළිබඳ දැනුම හා සංගීතඥයන්ගෙන් සිදුවූ සේවාව.

ප්‍රායෝගික විෂය නිර්දේශය :

මෙහෙ ගී, කෙළි ගී, ප්‍රශස්ති ගී, වන්නම්, ශාන්තිකර්ම ගී, නූර්ති ගී, ජන නාට්‍ය, තිත් රූප, ස්වර අභ්‍යාස (පල්ටා), රාග හා තාල පිළිබඳ අවබෝධය.

අනුවිෂය :

ස්වර අභ්‍යාස, රාග, තාල හා ජන ගී පිළිබඳ අවබෝධය හා ගායනය හෝ වාදනය.

05. අයදුම්කරුවන්ට උපදෙස් :

*සුදුසුකම්* :

(*අ*) කලායතනයක ලියාපදිංචි ශිෂ්‍යභාවය තිබිය යුතු ය.

(*ආ*) කලායතන විෂය නිර්දේශය සම්පූර්ණයෙන් හදරා අවසන් කළ බවට කලායතනාධිපති සහතික කළ යුතු ය.

(*ඇ*) ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිට සමත්වන සියළුම අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීම අනිවාර්ය වේ.

(*ඈ*) පරීක්ෂණයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ට ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්න පත්‍ර දෙක හා ප්‍රායෝගික පරීක්ෂණය යන තුනට වෙන වෙනම ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු 40% කට නොඅඩුව ලබාගත යුතු අතර ප්‍රායෝගික පරීක්ෂණයෙන් ද ලකුණු 40%කට නොඅඩුව ලබාගත යුතු ය.

06. වයස් සීමාව :

2016 නොවැම්බර් මස 30 වැනි දිනට වයස අවු. 15 සම්පූර්ණ විය යුතු අතර උපරිම වයස් සීමාව අවු. 25කි. නියමිත වයස් සීමාව සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට විභාගය සඳහා අයදුම්කළ නොහැක.

07. *අයදුම්පත්* :

7.1 ජාතික කලායතන විභාගය සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සිංහල මාධ්‍ය කලායතන සඳහා ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා යථා කාලයේ දී සපයනු ලැබේ. නියමිත දින වකවානු තුළ ඉල්ලුම් පත්‍ර නොලැබුනහොත්, කලායතනයේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් සංඛ්‍යාව යන විස්තර සඳහන් ලිපියක් පහත සඳහන් ලිපිනයට 2016 නොවැම්බර් මස 30 දිනට පෙර එවිය යුතු ය.

''සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.''

කවර හෝ අයදුම්කරුවෙකුට බාහිර අයදුම්කරුවෙකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

7.2 ප්‍රථම වසර පරීක්ෂණයේ දී තෝරා ගන්නා ගණය (විෂය) දෙවන හා තෙවන වසර පරීක්ෂණය සඳහා ද යෙදේ. අයදුම්කරුවන් ප්‍රථම වසර පරීක්ෂණයේ දී තෝරා ගන්නා ගණය (විෂය) දෙවන හා තෙවන වසර පරීක්ෂණය සඳහා වෙනස් කළ නොහැකිය.

7.3 අදාළ කලායතනාධිපති විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් තුනකින් යුක්තය. කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ප්‍රථම වසර අයදුම්කරුවන්ට කහ සහ කොළ වර්ණයෙන් යුක්ත අයදුම් පත්‍ර දෙක සම්පූර්ණ කර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට එවිය යුතු අතර, අනෙක් සුදු වර්ණයෙන් යුක්ත පිටපත සම්පූර්ණ කර කලායතනාධිපති ළග තබාගත යුතුය. දෙවන වසර සඳහා නිල් හා රෝස වර්ණයෙන් යුක්ත අයදුම් පත්‍ර දෙක සම්පූර්ණ කර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට එවිය යුතු අතර, අනෙක් සුදු වර්ණයෙන් යුක්ත පිටපත සම්පූර්ණ කර කලායතනාධිපති ළග තබාගත යුතුය. සියළු පිටපත් සඳහා කලායතනාධිපතිගේ අත්සන හා නිල මුද්‍රාව තැබිය යුතුය.

7.4 විභාගයට ඉදිරිපත්වන සියළු අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍රයෙහි සම්පූර්ණ කර ඇති තොරතුරුවල නිවැරදි බව පෞද්ගලිකව පරීක්ෂා කර බලා අත්සන් කළ යුතුය. අයදුම්කරුවන් අත්සන් කර නැති, මකන දියර භාවිතා කරන ලද හා වෙනත් අඩුපාඩුකම් සහිත ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.5 සම්පූර්ණ කරන ලද අයදුම්පත් කලායතනාධිපති විසින් 2016 දෙසැම්බර් මස 16 දිනට පෙර ''සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදංචි තැපෑලෙන් එවිය යුතුය. මෙම දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.6 අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ජාතික කලායතන (නැටුම්/සංගීත) විභාගය - 2016'' යනුවෙන් සඳහන් කළ යුතුය.

7.7 අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පෙනී සිටිය යුතු විෂයන් හා අනෙකුත් විස්තර සඳහා අදළ ව්‍යවස්ථාව හා නිර්දේශ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. විෂය අංක නිවැරදිව සටහන් කළ යුතුය. ඉතා නිවැරදිව අයදුම්පත සම්පූර්ණ කළ යුතු බව අවධාරණය කරමි. මෙම විභාගය සඳහා පළමුවරට ඉදිරිපත්වෙන අයදුම්කරුවන් සඳහා කිසිදු මුදලක් අයකරනු නොලැබේ. කලායතන විභාගයේ සමස්ත ප්‍රතිඵලය 40% ක් නොලබා, ඌන සමාර්ථයක්* ලබාගත් අයදුම්කරුවන් සඳහා පමණක් රු. 150 ක විභාග ගාස්තුවක් අය කරනු ලැබේ. අදළ ගාස්තුව ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ලංකා බැංකුව, බත්තරමුල්ල ශාඛාවේ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂකගේ 7041213 ගිණුම් අංකයට බැර කර ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළග තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තු කිසිදු අවස්ථාවක ආපසු ගෙවනු නොලැබේ. (මුද්දර හා මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.)

**ඌන සාමාර්ථ* - කිසියම් අයදුම්කරුවෙකු ලිඛිත පරීක්ෂණයේ දී ප්‍රධාන විෂයයට ලකුණු 40% කට නොඅඩුව ලබා සංස්කෘතික පසුබිම (15/25) විෂයය

අසමත් වන්නේ නම් ඔහු ඌන සාමාර්ථය ලද අයෙකු සේ සැලකේ. එම ඌන සාමාර්ථය අනුයාත විභාග වසර දෙකක දී සම්පූර්ණ කල යුතුය. ඌන සාමාර්ථය ලද අපේක්ෂකයෙකුට ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පෙනී සිට සාමාර්ථය ලබා ගත්ත ද ඌන සාමාර්ථය ලද විෂයය සමත් වන තෙක් සම්පූර්ණ විභාගය සමත් වූවෙකු සේ නොසැලකේ. කිසියම් අයදුම්කරුවෙකු ප්‍රධාන විෂයය අසමත් වී සංස්කෘතික පසුබිම විෂයය (15/25) සමත් වුවද ඔහු ලිඛිත පරීක්ෂණය අසමත් වූවෙකු සේ සලකනු ලබන අතර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලබයි.)

08. *ප්‍රවේශ පත්‍ර :*

විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවෙකු සඳහාම, විභාග කොමසාරිස් ජනරාල් විසින් සියළුම කලායතනාධිපතිවරුන් වෙත ප්‍රවේශ පත්‍ර කට්ටල නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර කට්ටලය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුයි. එහිදී ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත, හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද ළග තබා ගත යුතු ය.

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකු විසින් ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන කලායතනාධිපති ලවා සහතික කරවාගෙන විභාගයට පෙනීසිටින අවස්ථාවේ දී විභාග ශාලාධිපති වෙත භාරදිය යුතුය.

09. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම එකක් පිළිගනු ලැබේ.

(i) තැපැල් හැඳුනුම්පත,
(ii) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
(iii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අවශ්‍ය වාද්‍ය භාණ්ඩ අයදුම්කරුවන් විසින් සපයා ගත යුතුය.

11. කිසියම් අයදුම්කරුවෙකු වෙත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අදාළ අයදුම්කරු විභාගය සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කිරීමක් නොවේ. අයදුම්කරු සපයා ඇති තොරතුරු සාවද්‍ය බව හැඟී ගියහොත්, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

12. කිසියම් විභාග අපේක්ෂයෙකු විභාගය සමත්වීම සඳහා ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයයෙන් ලකුණු 40% කට නොඅඩුව හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු 40%කට නොඅඩුව ලබා ගත යුතුය. ලිඛිත විභාගය සඳහා 40% ක් ලබා නොගත් සිසුන්ට, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සුදුසුකම් නොලැබේ. ලිඛිත පරීක්ෂණයට ලකුණු 40%කට නොඅඩුව ලබන ප්‍රායෝගික පරීක්ෂණයට සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ ප්‍රථිපල ඇතුළත් ලේඛනය අදළ කලායතනාධිපති වෙත ලබා දෙනු ඇත. ලිඛිත හා ප්‍රායෝගික පරීක්‍ෂණවල සමස්ථ ප්‍රතිඵලය කලායතනාධිපති වෙත ලබාදෙන අතර, විභාග අපේක්ෂකයින් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව යැවීම අදළ කලායතනාධිපති විසින් සිදු කරනු ලැබේ.

13. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-39 | අසමත් | F |
| 40-50 අතර | සාමාන්‍ය | S |
| 51 -60 අතර | සම්මාන | C |
| 61 - 70 අතර | අධි සම්මාන | B |
| 71- 100 අතර | විශිෂ්ඨ සම්මාන | A |

අනූෂා ගෝකුල ප්‍රනාන්දු,
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ.

2016 ඔක්තෝබර් මස 28 වැනි දින,
බත්තරමුල්ල, සෙත්සිරිපාය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය I**

විභාගය පැවැත්වෙන නගර හා නගර අංක පහත සඳහන් පරිදි වේ.

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| කොළඹ | 01 | මහනුවර | 10 |
| ගම්පහ | 02 | කෑගල්ල | 11 |
| කළුතර | 03 | මාතලේ | 12 |
| ගාල්ල | 04 | බදුල්ල | 13 |
| මාතර | 05 | අනුරාධපුරය | 14 |
| තංගල්ල | 06 | පොළොන්නරුව | 15 |
| රත්නපුර | 07 | කුරුණෑගල | 16 |
| අම්පාර | 08 | කුලියාපිටිය | 17 |
| මොනරාගල | 09 | | |

**(අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර පසු පිටුවේ සඳහන් උපදෙස් හොඳින් කියවන්න)**

**මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කර සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට එවීමට කටයුතු කරන්න.**

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
## ජාතික කලායතන විභාගය - 201....

1.0 කලායතනයේ නම සහ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්).
.......................................................................................
.......................................................................................
.......................................................................................

1.1 කලායතනය අයත් දිස්ත්‍රික්කය : - .............................. (ඉංග්‍රීසියෙන්)

| දිස්ත්‍රික් අංකය | |
|---|---|

(පසුපිටුවේ ලේඛනය බලන්න)

1.2 දුරකථන අංකය : - .......................................................

විභාගයට ඉදිරිපත් වන මුළු අයදුම්කරුවන් ගණන : ☐

ඉදිරිපත්වන විභාගය : ☐
1 පළමු වසර, 2 දෙවන වසර, (අදාල අංකය කොටුව මත ලියන්න)

2.0 කලායතන පරිගණක අංකය

| | | | | | |
|---|---|---|---|---|---|

(කලායතන ලි.ප. අංකය ..................)

3.0 විභාගයට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය :

3.1 ඉල්ලුම් කරන නගරය :

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)..........................

(සිංහලෙන්) ..............................................

3.2 නගර අංකය ☐

(පසුපිටුවේ ලේඛනය බලන්න)

| 4.0 | 5.0 | 6.0 | 7.0 | 8.0 | | | | | 9.0 | 10.0 | 11.0 | 12.0 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විෂයයන් | | | | | | | | |
| අනු අංකය | වාසගම සහිත සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න)<br>උදාහරණ :- RUWAN SAMPATH BANDARA<br>(පසුපිටේ 5.0 පරිදිම නම් ඇතුළත් කරන්න) | ජාතික හැඳුනුම්පත් අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල අංකය ලියන්න)<br>ස්ත්‍රී - 1<br>පුරුෂ - 0 | උඩරට නර්තනය (11/21) Kandian Dancing | පහතරට නර්තනය (12/22) Low Country Dancing | සබරගමු නර්තනය (13/23) Sabaragamu Dancing | සංගීතය (14/24) Music | අනිවාර්ය සංස්කෘතික පසුබිම (15/25) Compulsory Cultural Background | ඊට පෙර සාමාර්ථයක් නම් එම අවස්ථාවේදී විභාගයට පෙනී සිටි විභාග අංකය | ඊට පෙර සාමාර්ථයක් ලබාගත් වර්ෂය | ගෙවූ මුදල (රුපියල්) නිදහස් නම් "F" ලියන්න | අයදුම්කරුගේ අත්සන |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත නම් සඳහන් අයදුම්කරුවන්, මෙම ආයතනයේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් බවත්, ව්‍යවස්ථා හා නිර්දේශ පත්‍රයෙහි 5වන ඡේදය යටතේ දක්වා ඇති අවශ්‍යතාවන් සපුරා ඇති බවත්, ඔවුන් මා ඉදිරියේ දී අත්සන් තැබූ බවත්, විභාග ගාස්තු ගෙවිය යුතු අයදුම්කරුවන් ..................ගෙන් අයකර ගන්නා ලද මුළු මුදල වන රුපියල් ............................ක් ලංකා බැංකුවට ගෙවා ඒ වෙනුවෙන් ලද අංක ......................හා .................... දින දරන ලදුපත මීට අමුණා ඇති බවත්, මෙයින් සහතික කරමි.

සකස් කළේ : නම :- ..................................................................
අත්සන : .................................. දිනය - ............................
පරීක්ෂා කළේ : නම :- ..................................................................
අත්සන .................................. දිනය - ..........................

කලායතන ප්‍රධානියාගේ අත්සන ........................
කලායතන ප්‍රධානියාගේ නම ........................
දිනය ..................................

කලායතනයේ නම/ලිපිනය සහිත මුද්‍රාව තබන්න

**අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් :**

සියළුම කලායතනාධිපතින් *ගැසට් පත්‍රයේ* 07ට අවධානය යොමු කර අයදුම්පත් සම්පූර්ණ කරන්න.

1.0 කලායතනයේ නම සහ සම්පූර්ණ ලිපිනය පැහැදිලිව ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.

1.1 කලායතනයේ ස්ථාවර දූරකතන අංකය සඳහන් කරන්න. ස්ථාවර දූරකතනයක් නොමැතිනම් පමණක් කලායතන ප්‍රධානියාගේ ජංගම දූරකතන අංකය සඳහන් කරන්න.

2.0 ඔබ කලායතනයට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති කලායතන ලියාපදිංචි අංකය ඔබට අදළ නගර අංකය (නගර අංක *ගැසට් පත්‍රයේ* සඳහන් පරිදි යොදන්න.) සමග අදළ කොටුව තුළ නිවැරදිව ලියන්න.

මුල් කොටු දෙක සඳහා ඔබගේ නගර අංකයද, ඊළඟ කොටු තුන සඳහා කලායතන ලියාපදිංචි අංකය ද නිවැරදිව ලියන්න.

*උද :* ගම්පහ නගරය - 02

කලායතන ලියාපදිංචි අංකය - 353

| | | | | |
|---|---|---|---|---|
| 0 | 2 | 3 | 5 | 3 |

3.0 විභාගය සඳහා ඉදිරිපත්වන මුලු අයදුම්කරුවන් සංඛ්‍යාව සඳහන් කරන්න. අයදුම්පත්‍රය පිටු කිහිපයක් ඇතුලත් වන්නේ නම් මුළු අයදුම්කරුවන් ගණන පළමුවන පිටුවේ පමණක් ඇතුලත් කරන්න.

4.0 මෙම ඉල්ලුම් පත්‍රය සමග ඔබ වෙත එවා ඇති *ගැසට්* පත්‍රිකාවේ සඳහන් පරිදි, ඉල්ලුම් කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න.

5.0 අයදුම්පත්‍රයට ඇතුලත් කරනු ලබන එක් එක් අයදුම්කරුවන්ගේ නමට අදළව අනු අංක 01, 02, 03 . . . . ආදී වශයෙන් සඳහන් කරන්න. නමක් ඇතුලත් කිරීම හැමවිටම අලුත් රූලකින් ආරම්භ කරන්න. අයදුම් පත්‍රය සඳහා මෙම එක් පත්‍රිකාවක් ප්‍රමාණවත් නොවන විටෙක තවත් මෙවැනි පත්‍රිකාවක් යොද ගත යුතු අතර, දෙවන පත්‍රිකාවේ අවසන් අයදුම්කරු දක්වාම, අනු අංක නිවැරදිව සඳහන් කළ යුතුය.

5.0 අයදුම්කරුවන්ගේ උපන් දිනය නිවැරදිව පරීක්ෂා කර බලා, වලංගු වයස් සීමාවට යටත් අයදුම්කරුවන්ගේ නම් පමණක් ඇතුලත් කිරීමට කලායතනාධිපති විසින් වග බලා ගත යුතුවේ.

6.0 ජාතික හැඳුනුම්පත් අංකය හෝ තැපැල් හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න.

7.0 විභාගය සිංහල මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

8.0 ස්ත්‍රී/පුරුෂ භාවය සඳහන් කිරීමේදී පුරුෂ නම් 0 ද, ස්ත්‍රී නම් අංක 1 ද යොදන්න.

9.0 ඉල්ලුම් කරන වසර නිවැරදිව සටහන් කරන්න. විෂය සටහන් කිරීමේදී විෂය හා විෂයට අදල අංකය යොදන්න. කහ වර්ණ හා කොළ වර්ණ අයදුම් පත්‍ර ප්‍රථම වසර සඳහාත්, නිල් හා රෝස වර්ණ අයදුම් පත්‍ර දෙවන වසර සඳහාත්, වෙන් වෙන්ව සම්පූර්ණ කර සුදු වර්ණ අයදුම් පත්‍ර සම්පූර්ණ කර කලායතනාධිපති ළඟ තබා ගත යුතු අතර, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට එවීමට ඇති ප්‍රථම වසර කහ, කොළ වර්ණ අයදුම් පත්‍ර හා දෙවන වසර නිල්, රෝස වර්ණ අයදුම්පත්‍ර සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂකගේ නමට ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කරන්න.

10.0 විභාගයට ගාස්තු අයකිරීම.- පළමුවරට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. එම අයදුම්කරුවන්ට කොටුව තුළ ''නිදහස්'' ලෙස සටහන් කරන්න. ඌන සමත් විෂයය සම්පූර්ණ කිරීමට අයදුම්කරන අයදුම්කරුවෙකු රු. 150 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. ඒ ඒ අයදුම්කරුගේ නම ඉදිරියෙන් අදළ කොටුව තුළ විභාග ගාස්තුව සඳහන් කරන්න. විභාග ගාස්තු ගෙවිය යුතු සියලුම අයදුම්කරුවන්ගෙන් එම මුදල අයකොට, එම සම්පූර්ණ මුදල ලංකා බැංකු ශාඛාවකින් සංස්කෘතික අධ්‍යක්ෂකගේ ගිණුම වෙත බැර කර ලබා ගන්නා ලදුපතෙහි මුල්පිටපත සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට එවනු ලබන ප්‍රථම වසර සඳහා සම්පූර්ණ කළ යුතු කහ වර්ණයෙන් යුක්ත එක් අයදුම්පත්‍රයක පමණක් 13.0 කොටුව තුළ අලවන්න.

10.0 ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවන් සම්බන්ධයෙන් පමණක් මෙම විස්තර සම්පූර්ණ කරන්න. :

10.1 ඌන සාමාර්ථ්‍යය ලත් වර්ෂයේ විභාග අංකය :

10.2 ඌන සාමාර්ථ්‍යය ලත් වර්ෂය

11.0 තම නම, ජාතික හැඳුනුම්පත් අංකය/තැපැල් හැඳුනුම්පත් අංකය පෙනී සිටින විෂයයන් හා අනෙකුත් තොරතුරු සියල්ල නිවැරදිව පරීක්ෂා කිරීමෙන් අනතුරුව තම අත්සන යොදන ලෙසට අයදුම්කරුවන් දැනුවත් කර අයදුම්කරුවන්ගේ අත්සන ලබා ගන්න. අයදුම්කරුගේ නම්, ඔවුන්ගේ අත්සන්, අනෙකුත් තොරතුරු නිවැරදිව ඇතුලත් වී ඇත්දැයි නැවත පරීක්ෂා කර බලා කලායතනාධිපති විසින් අත්සන් කර කලායතන ප්‍රධානියාගේ නම ද සඳහන් කළ යුතුය. වෙන්කොට ඇති ස්ථානයේ කලායතනයේ මුද්‍රාව තබන්න.

12. අසම්පූර්ණ හා අදළ කොන්දේසි වලට යටත් නොවන අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින්, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම කලායතන ප්‍රධානියාගේ වගකීමක් බව සැලකිය යුතුය.

13. ලංකා බැංකුවෙන් ලබාගත් ලදුපත මෙහි අලවන්න.

11-686

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.